**ශීර්ෂය 298 - මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ, ගණන්දීමේ නිලධාරීගේ හා ආදායම් ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යාවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යාවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 298 - මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන , වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජුලි 31 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා

කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණ

----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරි එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128 (1) (අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. නව පර්යේෂණාගාර ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතීම. | 2.1 (අ) |
| | | 2. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම. | 2.1(ආ), (ඇ), (ඈ) |
| | | 3. නියමිත ආකෘති ප්‍රකාරව ප්‍රසම්පාදනයන් සැලසුම් නොකිරීම. | 2.3 |
| | | 4. අධි ප්‍රතිපාදන සලසා තිබීම. | 2.4 |
| | | 5. අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබීම. | 2.6 |
| | | 6. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.8 |
| 128(1)(ඈ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම. | 2.5 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශන හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව. | කාර්යසාධන වාර්තාව ඉදිරිපත් නොකිරීම. | 2.2 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබීම. | 2.7 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

------------------------------------------------

### 2.1 කාර්යසාධනය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 08 දින විවෘත කරන ලද නව පර්යේෂණාගාර ගොඩනැගිල්ල සඳහා රු.මිලියන 768 ක් වැයකර තිබුණද එහි ඇතුළත පවතින මනුෂ්‍ය ශරීරයට අහිතකර වායු තත්ත්වයක් ඇතිවීම හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව පැවතුණි. 2016 වර්ෂයේදී එම අහිතකර වායු තත්ත්වය ඇතිවීම වැළැක්වීම සඳහා ඇතුළත වායු සමීකරණ පද්ධතියක් සවිකිරීමට සැලසුම් කර තිබුණද අධිකරණයේ පවතින නඩුවක් හේතුවෙන් වායු සමීකරණ පද්ධති සවිකිරීමට 2017 වර්ෂය අවසන් වන විටද නොහැකිව තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී පෙර ඇසුරුම් භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් රු.100,000 ක ආදායමක් උපයා ගැනීම සඳහා පිරියත 5 ක් පරීක්ෂා කිරීමට ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම් කර තිබුණද ඇසුරුම් පරීක්ෂා කිරීම් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු අරමුදලින් මුදල් රු.මිලියන 20 ක් භාවිතා කර විද්‍යාගාර උපකරණ මිලදී ගැනීම සහ සවිකිරීම සඳහා 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. මේ සඳහා රු.මිලියන 16 ක් වැයකර තිබුණද අත්කරගත් භෞතික ප්‍රගතිය සියයට 8 පමණක් විය.

(ඈ) 2015 වර්ෂයේදී විවෘත කරන ලද ජාතික මිනුම් විද්‍යාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිමකර නොතිබුණි. මේ නිසා ඒ වෙනුවෙන් ගෙවීම් කිරීමට වෙන්කර තිබූ රු.මිලියන 30 ක මුදල රඳවා තබා ගැනීමට සිදුව තිබුණි.

### 2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

---------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජුනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.3 ප්‍රසම්පාදනයන් සැලැසුම් කිරීම

---------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘති ප්‍රකාරව පෙර වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාත්මක වන ප්‍රසම්පාදන සහ නව ප්‍රසම්පාදන වෙන් වෙන්ව දක්වා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

---------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 63.35 | 63.04 | 0.31 | 0.49 |
| | මූලධන | 225.50 | 212.36 | 13.14 | 5.83 |
| | **එකතුව** | **288.85** | **275.40** | **13.45** | **4.66** |
| 2014 | පුනරාවර්තන | 71.86 | 71.33 | 0.53 | 0.74 |
| | මූලධන | 230.50 | 221.48 | 9.02 | 3.91 |
| | **එකතුව** | **302.36** | **292.81** | **9.55** | **3.16** |
| 2015 | පුනරාවර්තන | 95.94 | 95.00 | 0.94 | 0.98 |
| | මූලධන | 220.50 | 220.36 | 0.14 | 0.06 |
| | **එකතුව** | **316.44** | **315.36** | **1.08** | **0.34** |
| 2016 | පුනරාවර්තන | 101.05 | 99.03 | 2.02 | 2.00 |
| | මූලධන | 210.00 | 130.84 | 79.16 | 37.70 |
| | **එකතුව** | **311.05** | **229.87** | **81.18** | **26.09** |
| 2017 | පුනරාවර්තන | 103.06 | 100.82 | 2.24 | 2.17 |
| | මූලධන | 70.00 | 21.58 | 48.42 | 69.17 |
| | **එකතුව** | **173.06** | **122.40** | **50.66** | **29.27** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 30 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනයක් නොකර මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයක් සඳහා අධි ප්‍රතිපාදනය සලසා තිබීම නිසා එම වැය විෂයය සඳහා ප්‍රතිපාදනය උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.මිලියන 18.4 ක් වූ අතර එය එම වැය විෂයය සඳහා වෙන්කල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 92 ක් විය.

**2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 29801දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 6.75 | 6.75 | 3.75 | 5.55 | 30 | 20.01 |

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව 2017 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ශේෂ හැර රු. 402,706 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 05 කාල පරාසයක සිට පැවත එමින් තිබුණු බව නිරීක්ෂණය විය. එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**2.6 අභ්‍යන්තර විගණනය**

ගණන්දීමේ නිලධාරීන් විසින් තම දෙපාර්තමේන්තුවල මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී හා වගකීම් ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතු බව මුදල් රෙගුලාසි 133 මඟින් අවධාරණය කර ඇත. එහෙත් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර අනුමත අභ්‍යන්තර විගණන නිලධාරී තනතුර සමාලෝචිත වර්ෂය අවසන් වන විටද පුරප්පාඩුව පැවතුණි.

**2.7 විගණන හා කළමනාකරණ කමිටුව**

දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

------------------------------------------------------------------------------------

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 99.4 ක් වැයකර තිබුණි.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 10 | 06 |
| (ii) | තෘතීයික මට්ටම | 30 | 09 | 21 |
| (iii) | ද්විතීයික මට්ටම | 198 | 119 | 79 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 104 | 61 | 43 |
| | | 348 | 199 | 149 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක්, තෘතීය මට්ටමේ පුරප්පාඩු 21 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 79 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 43 ක් සමඟ මුළු පුරප්පාඩු 149 ක් එනම් අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 43 ක් පුරප්පාඩුව පවතින අතර දෙපාර්තමේන්තුවේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට අවශ්‍ය තනතුරු හඳුනාගෙන ඒවා පිරවීමට කටයුතු කර නොතිබුණි.

(i) අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 අතුරින් අධ්‍යක්ෂ තනතුර ඇතුළුව තනතුරු 5 ක් එනම් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර, සහකාර අධ්‍යක්ෂ තනතුර, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුර හා ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) තනතුර යන තනතුරු හා අනුමත තෘතීයක මට්ටමේ තනතුරු 30 අතුරින් තනතුරු 21 ක්ද පුරප්පාඩුව පැවතුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ද්විතීයක මට්ටමේ තනතුරු 79 ක් පුරප්පාඩුව පැවති අතර ඒ අතුරින් මිනුම් විද්‍යා පරීක්ෂක නිලධාරී තනතුරු 15 ක්, මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක නිලධාරී තනතුරු 31 ක් හා අනුමත විද්‍යාගාර සහායක තනතුරු 4 ම සහ අනුමත තනතුරු සංඛ්‍යාව එකක් පමණක් වන තනතුරු 05 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවතුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍ය නම් නිත්‍ය පත් කිරීම නොපමාව කළ යුතු වුවත්, 2009 මැයි 14 දින හිටපු අධ්‍යක්ෂවරයා විශ්‍රාම යාමෙන් පසු එදින සිට 2017 දෙසැම්බර් 31 දින වන විටත් පුරප්පාඩුව සම්පූර්ණ කිරීමකින් තොරව වැඩ බලන පදනම මත නිලධාරියකු පත්කර තිබුණි.